**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2021 මාර්තු 31 | කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන විධාන | 2021 අංක 03**

**ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම**

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.
කොවිඩ්-19 වසංගතයේ දෙවන ව්‍යාප්තිය හේතුවෙන් ඇති වී තිබෙන අභියෝගාත්මක මෙහෙයුම් තත්ත්වය සලකා බලමින්, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 06 දරන ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම විධානයට පහත සංශෝධනයන් නිකුත් කරනු ලබයි.

ඒ අනුව, කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 06 දරන ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම විධානයේ අංක 2 විධානය පහත ලෙස ප්‍රතිස්ථාපනය කෙරේ.

| | | |
|---|---|---|
| 2. වලංගු කාල පරිච්ඡේදය | 2.1 | වර්තමාන අභියෝගාත්මක තත්ත්වය මත ද්‍රවශීලතාවය පිළිබඳ අපහසුතාවයන්ට පත්ව සිටින විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට පහසුකම් සැලසීම සඳහා 2021.06.30 දින දක්වා මාස තුනක (3) කාලයක් සඳහා විධානය දීර්ඝ කරන ලදී. |
| | 2.2 | ඉහත 2.1 හි දක්වා ඇති දීර්ඝ කිරීමේ කාලය ඉකුත්වීමෙන් පසු 2012 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ද්‍රවශීල වත්කම්) විධානය අනුව ද්‍රවශීල වත්කම් අවශ්‍යතා පවත්වා ගැනීම සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අවශ්‍ය පියවර ගත යුතුය. |

**ජේ ඩී එස් ජේ නානායක්කාර**
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව